**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.27 පැය 1730 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2123/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි පවතින අයහපත් කාළගුණික තත්ත්වය සම්බන්ධව - පොලිස් මූලස්ථානය.

මෙම දිනවල දිවයින පුරා විවිධ ප්‍රදේශයන්හි පවතින අයහපත් කාළගුණික තත්ත්වය හේතුවෙන් පස්කඳු කඩාවැටීම්, ජල ගැලීම් සහ දැඩි සුළං තත්ත්වය හේතුවෙන් විශාල වශයෙන් මහජනතාව අනතුරු වලට හා පීඩාවට පත් වී ඇත.

සිදුවන අනතුරු වළක්වා ගැනිම සඳහා රජය, ශ්‍රී ලංකා පොලිසිය, ත්‍රිවිධ හමුදාව සහ අපදා කළමණාකරන නිලධාරින් ඇතුළු කාර්ය මණ්ඩල දැඩි කැපවීමකින් කටයුතු කරන අතර ඔවුන් විසින් ලබා දෙන උපදෙස් නිසියාකාරව පිළිපැදීම මහජනතාවගේ වගකීමක් වන අතර ඔවුන් විසින් ලබාදෙන උපදෙස් හා පූර්ව දැනුම් දීම් නිසි ලෙස පිළිපදින ලෙසට දන්වා සිටිමු.

රජය විසින් යම් කිසි ප්‍රදේශයක් පූර්ව අවදානම් කලාපයක් ලෙස නිවේදනය කර ඇත්නම් හෝ තමන් සිටින යම් ප්‍රදේශයක අවදානමක් පවතින බවට තමාට හැඟේ නම් වහාම ආරක්ෂිත ස්ථානයකට හෝ රජය මගින් ස්ථාපිත කර ඇති ආපදා මධ්‍යස්ථාන වලට හැකි ඉක්මනින් යොමු වෙන ලෙස දැනුම් දෙනු ලබයි.

යම්කිසි පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් මේ වන විට ආපදාවට ලක්ව සිටී නම් හැකි ඉක්මණින් පොලිසිය හෝ සහන කණ්ඩායම් වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙස පොලිසිය දන්වා සිටියි. ආපදා මධ්‍යස්ථාන වලට අවශ්‍ය ආහාර හා සනීපාරක්ෂක කටයුතු හා අනෙකුත් පහසුකම් එම මධ්‍යස්ථාන වල සලසා ඇත.

ඔබ රථවාහන වලින් ගමන් කරන්නේ නම් අවදානම් කලාප මගහැර ඉතා කෙටි ගමනාන්තයක් දක්වා ගමන් කිරීමට කටයුතු කරන ලෙසත්, විනෝද චාරිකා ආදී අත්‍යාවශ්‍ය නොවන ගමන් බිමන් මෙම ආපදා තත්ත්වය පහව යන තුරු සිදු නොකිරීමට වග බලා ගන්නා ලෙසටත් දැනුම් දෙමි.

තවද, මෙම ආපදා තත්ත්වය පහව යනතුරු අනතුරු සහිත ප්‍රදේශ නැරඹීමට හෝ, අනාරක්ෂිත ස්ථාන වල ජල ක්‍රීඩා නොකිරීමටත්, ලබාදෙන ලද උපදෙස් හා පූර්ව දැනුම් දීම් නිසියාකාරව පිලිපදින ලෙසටත් පොලිසිය මහජනතාවට දැනුම් දෙමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**